# Royal college Colombo07
## රාජකීය විද්‍යාලය රාජකීය විද්‍යාලය

Grade 11 First term test - 2021 June

පළමු වාර පරීක්ෂණය - 2021 ජූනි - 11 ශ්‍රේණිය

කාලය පැය 02

## නාට්‍ය හා රංගකලාව II
## Drama &Theatre II

| 50 | S | ii |
|---|---|---|

නම........................................ පන්තිය............. විභාග අංකය ..................

පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1) දික්තල කාලගෝල නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. මෙම නාට්‍ය ප්‍රථමවරට වේදිකා ගත කළ වර්ෂය කුමක්ද ? (ල2)

ii. මෙම නාටකයේ ඇති නාට්‍ය ධර්මී රංග ශෛලිය පෙන්නුම් කරන අවස්ථා දෙකක් ලියන්න (ල2)

iii. මෙම නාටකයේ ඇති ප්‍රබලතා දෙකක් ලියන්න (ල2)

iv. මෙහි සංගීත අධ්‍යක්ෂවරයා කවුද (ල2)

v. මෙම නාට්‍යට පදනම් වූ මූල බීජය කුමක්ද ? (ල2)

vi. මෙහි වර්තමානයේ රඟපාන නළුවෙකු සහ නිළියක නම් කරන්න. (ල2)

2) i. අංගරචනය යනු කුමක්දැයි නිර්වචනය කරන්න (ල2)

ii. අංගරචනයේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න (ල2)

iii. අංගරචනයේදී යොදාගන්නා ද්‍රව්‍ය සහ උපකරණ 6ක් නම් කරන්න (ල6)

3)



I. ඉහත ඡායාරූපයේ දැක්වෙන ගැමි නාටකය කුමක්ද ? (ල2)

ii. එම ගැමිනාටකය රඟදැක්වීමේ පරමාර්ථ 4ක් ලියන්න (ල4)

iii. මෙම ගැමි නාටකයේ රංග ශෛලියේ විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න (ල6)

4) I. අභිරූපනය යනු කුමක්ද ? (ල2)

ii. අභිරූපනයේදී යොදා ගනු ලබන ශිල්ප ක්‍රම 2ක් නම් කර කෙටියෙන් හඳුන්වන්න (ල4)

iv. අභිරූපන රංගයක් තුල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ ලියා දක්වන්න (ල6)

5) i ප්‍රසාංගික කලාව යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ල2)

ii ප්‍රාසාංගික නොවන කලාවන් 4ක් නම් කරන්න (ල4)

iii ප්‍රාසාංගික කලාවේ ලක්ෂණ විස්තර කරන්න (ල6)

6) I. මෙරට ලෝකධර්මී නාට්‍ය කලාව ප්‍රචලිත කල නාට්‍ය කරුවා කවුද ? (ල2)

ii. මොහුගේ නාට්‍යධර්මී නාට්‍ය 4ක් නම් කරන්න (ල4)

iii. මෙම නාට්‍යකරුවාගෙන් සිංහල නාට්‍යකලාවට සිදුවූ සේවය අගයන්න (ල6)

7) පහත දැක්වෙන කතා සැකිල්ල ඔබ කැමති අවසානයක් කරා ගෙනයමින් කෙටි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබ කැමති පරිදි චරිත පුද්ගලනාම ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකිය.

තම දරුවාට පාසලේ විනෝදචාරිකාව යාමට අවශ්‍ය මුදල් සොයා ගැනීමට නොහැකි වූ ගිරිගෝරිස් අවසානයේ බස් රථයක් තුලදී පර්ස් එක්ක සොරා ගනී.....
එතැන් සිට ...............

I. පසුබිම, කාලය හා චරිත මැවීම ඔබට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ල4)

i. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථා ගොඩනැගීම සඳහා (ල4)

ii. දෙගිඩියාව, උත්ප්‍රාසය, කුතුහලය සහිත නාටෝයෝචිත අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා (ල4)

(මුළු ලකුණු 12X5 =60)

Royal college Colombo07

රාජකීය විද්‍යාලය රාජකීය විද්‍යාලය

Grade 11 First term test - 2021 June

පළමු වාර පරීක්ෂණය - 2021 ජූනි - 11 ශ්‍රේණිය

කාලය පැය 01

## නාට්‍ය හා රංගකලාව I
## Drama &Theatre I

| 50 | S | I |
|---|---|---|

නම....................................... පන්තිය............. විභාග අංකය ..................

- සැළකිය යුතුයි
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2), (3),(4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න

පහත දැක්වෙන පදය පාඨ ඇසුරින් අංක 01 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

(A) අත්තක පිපි මලක් ලෙසේ - පෙත්තක ඇඳි ඉරක් ලෙසේ
සත්තක මගේ පුතුගෙ යසේ - නෙත් දෙක හැර බලන් මෙසේ.......

(B) ගව සම්පත් බෝ වේවා - ගහ කොළ පලදාවේවා
ගජ කුලු බය නැති වේවා - ගණදෙවි නුවණක් දේවා...........

(C) ඇන්නෑවේ මේ මල කෝලම් - පාරෙ යන්නට බෑ මුන්දෑ සමගින්
මව්පියෝ නිදහස් වෙන්ට සිතා - බැඳ දුන්නේය මා මේ අඟුටු මිටියටා...........

(D) තවාලා රෙද්ද හැලියේ ඔබනකොට - රවාලා පැනපි මහ ඉණි කුණා ගෙට
අඩාලා පැනපි කොල්ලෝ දොර පිලට- කපාලා දෙමුව කොටඹේ වීරයට.........

(E) දී කිරි දීකිරි - ගෙනාව දීකිරි
මිහිපිට කාටත් - ගුණ දෙන දීකිරි................

(1) ඉහත පද්‍ය ඛණ්ඩ ඇසුරින් රටයතුම ශාන්තිකර්මයට අයත් වන්නේ

(1) A වේ (2) B වේ (3) C වේ (4) D වේ

(2) ඉහත C හි සඳහන් නාට්‍යයේ ගීතයේ කතා පුවත වන්නේ

(1) නරියෙකු ගම දුවක් විවාහ කරගැනීමේ කතා පුවතයි
(2) ලෙන හැරදාගිය සිංහබාහු, සිංහ සීවලී. සුප්පාදේවිය පිළිබඳ කතාවයි
(3) දික්තල, දික්පිටියා හා කාලගෝල සම්බන්ධ කතාවයි
(4) කැලනි ගඟ පිටාර ගැලීමෙන් තම උන්හිටි තැන් අහිමි වූ පිරිසක ගේ කතාවයි

(3) උඩරට සොකරි ජන නාටකයට අයත් පද්‍ය වන්නේ

(1) A වේ (2) B වේ (3) C වේ (4) D වේ

(4) ලූෂන් බුලත්සිංහයන්ගේ නාට්‍යකට අයත් ගීයක් වන්නේ කුමන පද්‍යක් ඇතුලත් අක්ෂරයක්ද ?

(1) A වේ (2) B වේ (3) C වේ (4) D වේ

(5) උඩරට ගැමි නාටකයක් හා ශාන්ති කර්මයක් නියෝජනය කරන පද්‍ය දෙක ඇතුලත් අක්ෂර වන්නේ

(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා E

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවලට නොගැලපෙන වරණය තෝරන්න

(6) රංගාලෝකය

(1) නළුවන් පැහැදිලිව දැක ගැනීමට උපකාරී වේ

(2) නාට්‍යයේ ශෛලිය ඉස්මතු කිරීමට ඉවහල් වේ

(3) කිසියම් දර්හනයකින් ඉස්මතුවන භාවය තීව්‍ර කිරීමට සමත්ය

(4) කිසියම් දර්ශනයක් සිදුවන කාලවේලාව දැක්වීමට උපකාරී වේ

(7) නළුවෙකු සතු විය යුතු ගුණාංග හා ලක්ෂණ අතරට අයත් වන්නේ

(1) සහජ හැකියාවය (2) සබකෝලය නැති තැනැත්තෙක් වීමය

(3) සුන්දර රූ සපුවක් තිබීමය (3) මනා ධාරණ ශක්තියක් තිබීමය

(8) රංග අභ්‍යාසවල නිරතවීමෙන් අත් පත් කර ගත හැකි ප්‍රතිලාභ වන්නේ

(1) ශරීරය නමනීය කර ගත හැකි වීමය

(2) ශරීරය හැඩ කර ගත හැකි වීමය

(3) සබකෝලය දුරු කර ගත හැකි වීමය

(4) සිරුර ස්ථූල කර ගත හැකි වීමය

(9) නාට්‍ය පෙළක් රචනා කිරීමේදී

(1) හේතු ඵල සම්බන්ධතාවය රැකෙන පරිදි තර්කානුකූලව ගැලපිය යුතුයි

(2) චරිත, අවස්ථා, හා සිද්ධි අතර ගැටුම් නිර්මාණය කළ යුතුය

(3) රංගනය සඳහාම වූ චරිත ඇතුලත් කළ යුතුය

(4) තෝරාගනු ලබන සියලුම අත්දැකීම් සුන්දර විය යුතුය

(10) නාට්‍යක යොදනු ලබන පසුතල නිර්මාණ

(1) සංකේතාත්මක අයුරින් යෙදිය හැකිය

(2) සැහැල්ලු ද්‍රව්‍ය යොදා නිර්මාණය කළ යුතුයි

(3) සැබෑ ජීවිතයේදී භාවිතාවන දේවලින් නිර්මාණය කළ ඒවා විය යුතුයි

(4) පහසුවෙන් සවි කිරීමට ගැලවීමට හැකි පරිදි සකස් කළ යුතුයි

- පහත දැක්වෙන වගුව ඇසුරින් 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්නපිරිත් පිංකමදොරකඩ අස්නසෑම ප්‍රදේශයකම......ක............ග.......දහ අට සන්නියපහතරටයකදුරා හා යක්ෂණියගම්මඩු/ දෙවොල් මඩු.....ජ.......පහතරටකන්නගී/ කෝවලන්හූනියම් කැපීම.......ට....පහතරටඇදුරා සහ බමුණාරටයකුමනානුමුරය....ඩ...........ගුරුන්නාන්සේ සහ ගැහැනු වෙස් ගත් ඇදුරා

(11) 'ක'හිස් තැනට සුදුසු පිළිතුර කුමක්ද ?

(1) භික්ෂූන් වහන්සේ හා බෙරකරු (2) භික්ෂූන් වහන්සේලා දෙනමක්

(3) භික්ෂූන් වහන්සේ හා දේව දූතයා 4) භින්ෂූන් වහන්සේ හා ගුරුන්නාන්සේ

(12) 'ග'හිස් තැනට සුදුසු පිළිතුර කුමක්ද ?

(1) මරා ඉපැද්දීම (2) දරු නැලවිල්ල (3) අඹ විදමන (4) සූනියම් යක්ෂණියගේ පැමිණීම

(13) 'ජ'හිස් තැනට සුදුසු පිළිතුර කුමක්ද ?

(1) අඹ විදමන (2) මරා ඉපැද්දීම (3) රාමා මැරීම (4) ඌරු යක්කම

(14) 'ට'හිස් තැනට සුදුසු පිළිතුර කුමක්ද ?

(1) ගුරුගේ මාලාව (2) අඹ විදමන (3) ගබඩා කොල්ලය (4) වඩිග පටුන

(15) ඩ'හිස් තැනට සුදුසු පිළිතුර කුමක්ද ?

(1) පහතරට (2) උඩරට (3) රජරට (4) සබරගමු

ත්වෙන රූප අතුරින් 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න


A


B


C


D


E

(16) ඉහත A රූපයේ දැක්වෙන සන්නිය වන්නේ

(1) අමුක්කු සන්නිය (2) කණ සන්නිය (3) දේව සන්නිය (4) නාග සන්නිය

(17) ඉදිරියේ ඇති පහනින් සිදුකරන කාර්යය වන්නේ

(1) සමූහයකින් එක් අයෙකු වෙන් කර පෙන්වීම
(2) සෙවනැලි ලබා ගැනීම
(3) වර්ණ ලබා ගැනීම
(4) ගගණිකාව ආලෝකමත් කිරීම

(18) C ඡායාරූපයේ දැක්වෙන නාට්‍ය කරුවා විසින් මෙරටට හඳුන්වාදෙන ලද වේදිකා විශේෂය කුමක්ද

(1) පින්තූර රාමු වේදිකාව (2) වටරවුම් වේදිකාව
(3) ජංගම රංගමඩල (3) කැරකෙන වේදිකාව

(19) D රූපයේ දැක්වෙන නාට්‍ය විශේෂය අයත්වන්නේ

(1) නෘත්‍ය ගනයට (2) නෘත ගනයට (3) නාට්‍ය ගනයට (4) ස්වභාවික නාට්‍යට

(20) E රූපයේ දැක්වෙන රංග භූමිය වන්නේ

(1) තානායම් පොල (2) ග්‍රීක රංගමඩල (3) යාග භූමිය (4) ප්‍රොසීනියම් රංගමඩල

- වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න

(21) කාව්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථයේ කතුවරයා ලෙස සැලකෙන්නේ

(1) භරත මුනි (2) ධනංජය පඬිවරයා (3) ඇරිස්ටෝටල් (4) විලියම් ශේක්ස්පියර්

(22) වේදිකානාට්‍යක ප්‍රධාන අරමුණ වන්නේ

(1) පණිවිඩයක් කීමයි (2) යහපත් ප්‍රේක්ෂාවක් මැවීමයි
(3) කතාවක් කීමයි (4) රසෝත්පාදනයයි

(23) ඔපෙරා කලාවේ වඩාත් කැපී පෙනෙන මාධ්‍ය වන්නේ

(1) නර්තනයයි (2) රංගනයයි (3) ගායනයයි (4) මුද්‍රාවයි

(24) වේදිකාව මත මොහොතින් මොහොත මැවෙන දර්ශනය හඳුන්වන නාමය වන්නේ

(1) රස වින්දනය (2) ප්‍රේක්ෂාව (3) අධ්‍යක්ෂණය (4) රංග වින්‍යාසය

(25) තමාගේ පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරන චලන රටාව හඳුන්වන්නේ

(1) ස්වභාවික චලන (2) තාලානුකූල චලන
(3) නිර්මිත චලන (4) නර්තනානුකූල චලන

(26) රංග රචනය යනුවෙන් හැඳින්වෙන්නේ

(26) රංග රචනය යනුවෙන් හැඳින්වෙන්නේ

(1) අංග රචනයයි (2) පෙළ රචනයයි (3) රංග වින්‍යාසයයි (4) කතා වින්‍යාසයයි

(27) නාට්‍යකදී ප්‍රේක්ෂක රසවින්දනයට ආසන්නම සාධකය වන්නේ

(1) රංග වින්‍යාසයයි (2) නළු කාර්යයි (3) රංගාලෝකයයි (4) ප්‍රේක්ෂාවයි

(28) වේදිකාවේ කලබලකාරී ස්වභාවයක් ඇති කරලීමට උපයෝග බර ගත හැකි පහන වන්නේ

(1) අල්ට්‍රාවයලට් (2) ස්ට්‍රොබ් (3) යොමු පහන (4) මිරර් බෝල්

(29) නාට්‍ය අධ්‍යක්ෂණයේදී අධ්‍යක්ෂවරයා

(1) නවක නළු නිලියන්ට පමණක් උපදෙස් ලබා දිය යුතුය

(2) ප්‍රවීණ නළුවන්ගෙන් උපදෙස් ලබා ගත යුතුය

(3) නාට්‍ය පෙළෙහි ඇති අර්ථකථනය මතුකරගත යුතුය

(4) සොඳුරු ආශ්වාදායකයෙක් විය යුතුය

(30) අභිරූපන මෙන්ම සිනමා නළුවෙකු ලෙස නම් දරා සිටි ශිල්පියා වන්නේ

(1) විමල් කුමාරද කොස්තා (2) අමරසිරි කලංසූරිය

(3) තිස්ස විජේසුරෙන්ද්‍ර (3) විජය නන්දසිරි

- 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරින් පිළිතුරු සපයන්නනාට්‍යයේ නමනිෂ්පාදනශෛලියමනමේA Eසිංහබාහු BFනරිබෑණා CGකැලනි පාලමDH

(31) වගුවේ ඨ කොටුවේ සඳහන් විය යුතු නිෂ්පාදක වරයා වන්නේ

(1) දයාන්නද ගුණවර්ධන (2) එදිරිවීර සරච්චන්ද්‍ර

(3) ජයලත් මනෝරත්න (3) ආර්. ආර් සමරකෝන්

(32) එකම නිෂ්පාදන වරයෙකුගේ නාට්‍ය ද්විත්වයක් වන්නේ

(1) 3හා 4 (2) 2 හා 3 (3) 1 හා3 (4) 2හා 4

(33) මනමේ නාට්‍යට අදාලව ඈ කොටුවේ සඳහන් විය යුතු පිළිතුර වන්නේ

(1) ලෝක ධර්මී (2) නාට්‍ය ධර්මී (3) විකාර රූපී (4) අසම්මත

(34) නරි බෑනා නාට්‍යට අදාලව ක කොටුවේ සඳහන් විය යුතු පිළිතුර වන්නේ

(1) සෝමලතා සුබසිංහ (2) ඩී කුමාරගේ

(3) දයාන්නද ගුණවර්ධන (4) ලූෂන් බුලත් සිංහල

(35) ය කොටුවේ සඳහන් විය යුතු පිළිතුර වන්නේ

()1 ලෝක ධර්මී (2) නාට්‍ය ධර්මී (3) ශෛලිගත (4) අර්ධ ශෛලිගත

- 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට මෙම ඡායාරූපය ඇසුරින් පිළිතුරු සපයන්න




(36) මෙම ඡායාරූපයේ දැක්වෙන දර්ශනය අයත් වන්නේ පහත කවර නාට්‍යකටද ?

(1) හුනුවටයේ කතාව (2) දික්තල කාලගෝල (3) විකෘති (4) කැලණි පාලම

(37) මෙම ඡායාරූපයේ දැක්වෙන නිලිය වන්නේ

(1) මැණිකේ අත්තනායක (2) මානෙල් ජයසේන

(3) මාලනී රණසිංහ (4) සෝමලතා සුබසිංහ

(38) මෙම ඡායාරූපයේ දැක්වෙන නාට්‍යයේ නිර්මාතෘවරයා වන්නේ

(1) එදිරිවිර සරච්චන්ද්‍ර (2) සේමලතා සුබසිංහ

(3) හෙන්රි ජයසේන (4) පුණ්‍යසේන ගුණසිංහ

(39) මෙම නාට්‍යයේ එන ගීතයක් නොවන්නේ

(1) රතඳර සිරියා පරන .............

() බොමා ජාති ඇත බෝවී............

(3) ගුරු දෙගුරු වැඩිමහලු ඔබ සැමට මංගලම්...........

(4) අම්බරයේ සඳ සේ දිලී..........

(40) මෙම රූපයේ දැක්වෙන ස්ත්‍රී චරිතයේ දැක්වෙන ලක්ෂණයක් නම්

(1) ආත්මාර්ථකාමී මුසා බස් තෙපලන්නියකි

(2) තම සැමියාට කීකරු තැනැත්තියකි

(3) සැම විටම සත්‍ය කතා කරන්නියකි

(4) ඉතා විරූපී ස්ත්‍රියකි

(මුළු ලකුණු 1 x 40 = 40)